දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை
District Secretariat - Hambantota

පළමු මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට, 1ஆம் மாடி, றுஹுணு மாகம்புர நிர்வாக கட்டிடத் தொகுதி, சிறிபோபுர, ஹம்பாந்தோட்டை 1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota

"සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා"
"சௌபாக்கியமான எதிர்காலத்திற்காக"
" For a prosperous future "

මගේ අංකය / எனது இலக்கம் / My No: DSH/DPS/7/DCC/Progress/2026
ඔබේ අංකය / உமது இலக்கம் / Your No:
දිනය / திகதி / Date: 2026.02.09

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - 2026.01.29</u>**

2026.01.29 වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යයන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටු කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතන වල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථා වලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03. එසේම, මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීම පිළිබඳ ප්‍රගතිය මා වෙත DCC Hambantota WhatsApp සමූහය වෙත හෝ dpshambantota@gmail.com වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04. තවද, මෙම වාර්තාව www.hambantota.dist.gov.lk දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබාගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

දුරකථන /ෆැක්ස් :- 0472256234
විද්‍යුත් ලිපිනය :- dpshambantota@gmail.com

පිටපත් -

1.හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා - කරු.දැ.ගැ.ස.
2.ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
3.ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දැ.ගැ.ස.


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர / District Secretary | 047 2256235 | අතිරේක දිස්ත්‍රික් ලේකම්(පාලන) / மேலதிக மாவட்ட செயலாளர (நிர்வாகம்) / Additional District Secretary (Admin) | 047 2256232 | අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්) / மேலதிக மாவட்ட செயலாளர (காணி) / Additional District Secretary (Land) | 047 2256002 | ප්‍රධාන ගණකාධිකාරී / கணக்காளர் / Chief Accountant | 047 2256246 |
| අධ්‍යක්ෂ (කෘෂිකර්ම) / பணிப்பாளர் (விவசாயம்) / Director (Agriculture) | 047 3628890 | අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) / பணிப்பாளர்(திட்டமிடல்) / Director (Planning) | 047 2256234 | සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவி மாவட்ட செயலாளர் / Assistant District Secretary | 047 2256945 | පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer | 047 2256285 |
| කාර්යාලය / அலுவலகம் / Office | 047 2256174 | ෆැක්ස් / தொலை நகல் / Fax | 047 2256235, 047 2256247 | | | | |

ඊ මේල්/ மின்னஞ்சல் / email : moha.dist.hambantota@gmail.com
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site : www.hambantota.dist.gov.lk

# හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම

## 2026.01.29

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්,හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු සියලුම දේශපාලන නායකත්වයෙන් මෙන්ම රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2026.01.29 වන දින පෙ.ව. 9.00ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ ගරු සම සභාපතිතුමා, ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පළාත් පාලන ආයතනවල ගරු නගරාධිපති හා සභාපතිවරුන් ඇතුළු දේශපාලන නායකත්වය හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් තුමා විසින් පිළිගැනීමෙන් අනතුරුව, 2025 වර්ෂය සඳහා ලැබී තිබූ සියලුම ප්‍රතිපාදන වැය කර අපේක්ෂිත සියලුම කාර්යයන් අවසන් කල බවත් භෞතික ප්‍රගතිය 100% ක් හා මූල්‍ය ප්‍රගතිය 94%ට ආසන්න බවත් දක්වමින් ඒ සඳහා සහය දැක්වූ දේශපාලන නායකත්වය සහ නිලධාරීන්ට ස්තූතිවන්ත වන බවත් පැවසීය. 2026 වසරේ දී එම සහයෝගය අපේක්ෂා කරන බවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් යෝජනා හඳුනාගෙන ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස් කරගනිමින් තබා ගන්නා ලෙසත් එම ලැයිස්තු පදනම් කරගනිමින් ප්‍රමාදයකින් තොරව ඉතිරි වන ප්‍රතිපාදන වෙනුවෙන් ව්‍යාපෘති කඩිනමින් අනුමත කරවා ගැනීමේ හැකියාවක් පවතින බවත් 2025 වසරේ ග්‍රාමීය මාර්ග සඳහා රු. මිලියන 66 ක් වෙන් කර ගැනීමට හැකියාව ලැබුන බවත් දැනුම් දීමෙන් අනතුරුව, ගරු සම සභාපතිතුමා වෙත රැස්වීමේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා ආරාධනා කරන ලදී. ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි සියළුම දෙනා පිලිගැනීමෙන් පසු 2025 වර්ෂයේ දිස්ත්‍රික්කයට වෙන්කරන ලද මුදල් වලින් අපේක්ෂා කරන ප්‍රතිඵල ලගා කරගනිමින් ජාතික අරමුණ සාක්ෂාත් කර ගැනීමට අභියෝග මැද කැපකිරීම් කර සේවයට කැප වූ නිලධාරීන්ට රජයේ ගෞරවය පුදකරන බවත් දැනුම් දෙන ලදී.

අනතුරුව, පසුගිය වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීමෙන් පසු රැස්වීම් වාර්තාව සභා සම්මත කර න්‍යාය පත්‍රයට අනුව සභාවේ කටයුතු සිදු කරන ලදී. එහිදී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01. | **2025.12.17 දිනැති සම්බන්ධීකරණ රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම.** | | | |
| 1.1 | අඟුණකොළපැලැස්ස නගර මධ්‍යය තුළ අඩක් ඉදිකර අතරමඟ නතරකර ඇති වෙළඳ සංකීර්ණය. | මෙම වෙළඳ සංකීර්ණය ඉතිරි වැඩ නිම කිරීමට අදාලව සකස්කරන ලද ඇස්තමේන්තුව ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කර ඇති බව දැනුම් දෙන ලදී. එමෙන්ම මේ පිළිබඳ සාකච්ඡාවක් 2026.01.23 දින පැවති බවත් එහිදී ලබාගත් තීරණ අනුව ඉදිරි වැඩ කටයුතු සිදු කිරීමට නියමිත බවට කරුණු ඉදිරිපත් විය. | එම කටයුතු කඩිනම් කරන ලෙසත් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ කමිටුවට වාර්තා කරන ලෙසත් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය |
| 1.2 | සංවර්ධන ව්‍යාපෘති සඳහා පස් ලබා ගැනීම | ඉතා හදිසි ක්ෂණිකව ක්‍රියාමාර්ග ගතයුතු අවස්ථාවල පස් අවශ්‍යතාවය පවතින බවත්, පසුගිය අවස්ථාවක වැලි ටිපර් රථයක් අත්අඩංගුවට ගෙන නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබෙන අතර ඒ හේතුවෙන් ව්‍යාපෘති සිදුකරන කොන්ත්‍රාත්කරුවන් අධෛර්යයට පත් වන බැවින් මේ සඳහා විධිමත් මැදිහත් වීමක් අවශ්‍ය බවට කරුණු දැක්විය. දිස්ත්‍රික්කයේ සංවර්ධන අවශ්‍යතාවයේ ස්වභාවය අනුව කටයුතු කිරීමේ දී සහයෝගය නොදක්වන්නේ නම් එම කටයුතු කරගෙන යාම අසීරු බවට ද කරුණු දැක්වීය. | රජයේ සංවර්ධන වැඩසටහන් වල දී නීතියේ සහයෝගය ලබාදීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී.<br><br>අදාල පරිදි රාජ්‍ය භාගය ගෙවීම් කර කඩිනමින් අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස දැනුම් දෙන ලදී. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි , තංගල්ල |
| 1.3 | වලව ගඟ මෝය ආශ්‍රිතව ජල පාලන ව්‍යාපෘතියක් යෝජනා කිරීම. | 2026.01.29 හා 30 වන දින ප්‍රධාන කාර්යාලය සමඟ සාකච්ඡාවක් පැවැත්වෙන බැවින් එම රැස්වීමේ දී මේ සම්බන්ධව ප්‍රගතියක් ලබා ගත | එකී තීරණය පරිදි කඩිනමින් ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ,<br><br>ප්‍රාදේශීය ලේකම්, |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | හැකි බවත් දන්වන ලදී. | | අම්බලන්තොට. |
| 1.4 | මුරුතවෙල ජල යෝජනා ක්‍රමය බැදිගම-මැදගොඩ හරහා වාඩිය ගම්මානයට දීර්ඝ කිරීම | දිස්ත්‍රික්කය තුල ජල අවශ්‍යතා සපුරාලීමට ඒකාබද්ධ වැඩසටහනක් සකස් කිරීම සුදුසු බවට යෝජනා වූ අතර ජලසම්පාදන මණ්ඩලය, වාරි මාර්ග දෙපාර්තමේන්තුව සහ ප්‍රජා ජල යන ආයතන ත්‍රිත්වය ඒකාබද්ධ වී වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම තුලින් දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුව විසඳීමට හැකියාවක් පවතින බවට කරුනු ඉදිරිපත් විය. මේ සඳහා හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අතුල වෙළඳගොඩ මැතිතුමා නම් කරන බවත් එතුමාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික්කයේ ජල ගැටළුව සඳහා විධිමත් සැලැස්මක් සකස් කලයුතු බවත් යෝජනා විය. | ජල සම්පාදන මණ්ඩලය කැඳවුම්කරු ලෙස කටයුතු කරමින් අදාල ආයතන කැඳවා ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රධානත්වයෙන් 2026.02.10 වන දින රැස්වීමක් සංවිධානය කර ඒකාබද්ධ සැලැස්මක් සකස් කරන ලෙසත් එම තීරණ අදාල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වෙත යොමු කර අවසන් එකඟතාවය දිස්ත්‍රික් සම්බන්දීකරණ කමිටුව වෙත දන්වන ලෙසත් උපදෙස් දෙන ලදී. | වාරිමාර්ග අධ්‍යක්ෂ වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br><br>ප්‍රාදේශීය කළමනාකරු, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br><br>ස්ථාන භාර නිලධාරි ප්‍රජා ජල දෙපාර්තමේන්තුව |
| 1.5 | මාර්ග අනතුරු අවම කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම | බහුලව මාර්ග අනතුරු පවතින ස්ථාන හඳුනාගෙන ඊට අදාල ස්ථාන වල වෙනස්කම් සිදු කිරීමට කටයුතු කිරීම සහ පොලීසිය මගින් මාර්ග ආරක්ෂණ කමිටු රැස්වීම් සිදුකරමින් පවතින බවට කරුණු ඉදිරිපත් විය. වැලි, ගල් ප්‍රවාහනය මෙන්ම හම්බන්තොට වරායට ගෙනෙන අමුද්‍රව්‍ය ගාල්ල දක්වා ප්‍රවාහනය සඳහා ටිපර් රථ හා විශාල ප්‍රමාණයේ ලොරි රථ (10 wheel) යොදා ගැනීම නිසා මාර්ග වල අධික වාහන තදබදයක් පවතින බවට කරුණු ඉදිරිපත් විය. එයට විසඳුමක් ලෙස ගල් සහ වැලි ප්‍රවාහනය කරන රථ වල ප්‍රවාහන ප්‍රවාහන කාල සීමාව ප.ව. 6.00 සිට පසු දින පෙ.ව. 6.00 දක්වා (රාත්‍රී කාලයේ) කාලය වෙන් කිරීමට වඩාත් සුදුසු බවට යෝජනා විය. එමෙන්ම තංගල්ල නගර මධ්‍යයට සමීපව පිහිටුවා ඇති කාගිල්ස් ආයතනය අසල මාර්ග තද බදයක් පවතින බවත් එයට විසඳුමක් ලෙස කලර් ලයිට් පද්ධතියක් ඇති කිරීම සුදුසු බවටත් යෝජනා විය. | දිස්ත්‍රික්කයේ අවශ්‍යතාවය සලකා දිස්ත්‍රික්කයෙන් පිටතට ගෙන යන අමුද්‍රව්‍ය (ගල්,වැලි) ප්‍රවාහනය සඳහා රාත්‍රී කාලය (ප.ව. 6.00 සිට පසු දින පෙ.ව. 6.00 දක්වා කාලය) යොදා ගැනීම සුදුසු බවටත් වරායෙන් ගෙන යන ද්‍රව්‍ය ප්‍රවාහනය සම්බන්ධව මාර්ග තදබදය අවම වන අයුරින් ක්‍රියා කරන ලෙස වරාය කළමනාකාරීත්වයට දැනුම් දීමටත් තීරණය විය. එමෙන්ම තංගල්ල නගරය සහ අනෙකුත් මාර්ග ගැටළු 2026.02.03 පැවැත්වීමට යෝජිත ප්‍රවාහන කමිටුවේ දී විසඳුම් ගැනීම සුදුසු බැවින් එයට යොමු කරන ලෙසත් උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි , තංගල්ල<br><br>කළමනාකරු හම්බන්තොට වරාය |
| 1.6 | හම්බන්තොට දිස්ත්‍රික්කයට අදාල සියළුම නගර සඳහා ප්‍රධාන සැලසුම් සකස් කිරීම | තංගල්ල නගර සංවර්ධන සැලසුම 2026 වර්ෂයේ අප්‍රේල් මස අවසන් කිරීමට සැලසුම් කර ඇති බවත් හම්බන්තොට මහ නගර සැලැස්ම 2026 වසරේ අවසන් කිරීමට කටයුතු කරන බවටත් කරුණු දැක්විය. | සියලුම සැලසුම් වලට අදාල වාර්තාවන් 2026.02.02 (ලබන සඳුදා) දිනලබාදීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය |
| 1.7 | ලුණුගම්වෙහෙර රෝහල ඇතුළත විෂ මත්ද්‍රව්‍ය පානය කිරීම | මේ සම්බන්ධව විමර්ශන කටයුතු සිදුකරගෙන යන අතර තවමත් සැකකරුවන් හඳුනාගෙන නොමැති | මේ සම්බන්ධව ලුනුගම්වෙහෙර පොලිසිය දැනුවත් කර | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |



විමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | බවටත් නඩු භාණ්ඩ පොලිස් භාරයට ගත් බවටත් කරුණු ඉදිරිපත් විය. | මෙම පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කරන ලෙසට උපදෙස් දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |
| 1.8 | වැලි කැණීම හේතුවෙන් පරිසර හානි සිදුවීම වලක්වා ගැනීම | මේ සම්බන්ධව වාර්තාව ලබා දී ඇති අතර තංගල්ල වැලිවත්ත ප්‍රදේශයේ ස්ථානයක අනවසර වැලි කපන බවට කරුණු ඉදිරිපත් විය. | මෙම අනවසර වැලි කපන ස්ථානය වැටලීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |
| 1.9 | හම්බන්තොට ආයුර්වේද රෝහල, විදුලිබල මණ්ඩලය ආදී ආයතන දක්වා පවතින ප්‍රවාහන ගැටලුව | 2026.01.23 පැවති විශේෂ සාකච්ඡාව අනුව නව බස් රථ කාල සටහන ඉදිරිපත් කරන ලදී. ඒ අනුව බස් රථ ධාවනය ක්‍රියාත්මක වන බවට ද කරුණු ඉදිරිපත් විය. එමෙන්ම අයුර්වේද රෝහල වෙත මීටර් 400 ක පමණ දුරක් යා යුතු බැවින් ද මෙම රෝහල සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන රෝගීන් ඉතා අසීරු මට්ටමේ සිටින අය බැවින් මෙම ලංගම බස්රථය පැයකට වරක් වත් ධාවනය කිරීම සුදුසු බවට යෝජනා විය. | මේ සම්බන්ධව කටයුතු කිරීමට ඇති හැකියාව පිළිබඳ සොයා බලන ලෙස උපදෙස් දෙන ලදී. | සභාපති<br>මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය<br>දකුණු පළාත<br><br>කළමණාකරු<br>අම්බලන්තොට ඩිපෝව |
| 02. | **2025 වසරේ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම.** | | | |
| 2.1 | 2025 වසර තුළ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් 08 ක් යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා 325 ක් වෙනුවෙන් රු.මි.722 ක ප්‍රතිපාදන ලබාදී ඇති බවත් සංවර්ධන ව්‍යාපෘති 325ම අවසන් කරමින් දිස්ත්‍රික්යේ භෞතික ප්‍රගතිය 100% ක් බවත් මූල්‍ය ප්‍රගතිය 94%ට ආසන්න බවත් සඳහන් කරමින් වැඩසටහන් වල 2025.12.31 දිනට අදාල ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කරන ලදි. | | | |

**ප්‍රතිපාදන ලැබීම් (රු.මි.) – 2025**

| | සංවර්ධන වැඩසටහන | අනුමත ප්‍රතිපාදන මුදල | අනුමත ව්‍යාපෘති ගණන | වැඩ අවසන් ව්‍යාපෘති ගණන | වියදම | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| 1 | විමධ්‍යගත අයවැය වැඩසටහන | 80 | 50 | 50 | 75.35 | 100% | 94.19 |
| 2 | දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන | 83 | 52 | 52 | 79.98 | 100% | 96.36 |
| 3 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන I | 79.2 | 28 | 28 | 74.06 | 100% | 93.51 |
| 4 | ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන II | 278.19 | 46 | 46 | 260.94 | 100% | 93.80 |
| 5 | නිල සෙවන වැඩසටහන | 92.93 | 129 | 129 | 87.51 | 100% | 94.17 |
| 6 | සංචාරක වැඩසටහන | 17.00 | 6 | 6 | 15.85 | 100% | 86.20 |
| 7 | ග්‍රාමීය සංවර්ධන වැඩසටහන | 70.00 | 5 | 5 | 60.34 | 100% | 86.20 |
| 8 | ක්‍රීඩාපිටි සංවර්ධන වැඩසටහන | 21.98 | 9 | 9 | 21.05 | 100% | 95.77 |
| | **එකතුව** | **722.30** | **325** | **325** | **675.08** | **100** | **93.36** |

| | | | | |
|---|---|---|---|---|
| 2.1.1 | 2026 වර්ෂයට අදාල සංවර්ධන යෝජනා | ➢ 2026 වර්ෂය සඳහා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය මගින් | | |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා රු.මිලියන 250ක් වෙන් කර ඇති බවත් මේ සම්බන්ධව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල ගරු සභාපතිවරුන් හා සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත අදාල චක්‍රලේඛය යොමු කර එහි පරිදි යෝජනා හඳුනාගෙන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු අනුමැතිය මත දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා යොමු කරන ලෙස දැනුම් දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව ප්‍රමුඛතාවය මත ප්‍රාදේශීය සම්බන්ධීකරණ අනුමැතිය සහිතව යෝජනා 88ක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බවත් දැනුම් දෙමින් එම යෝජනා කමිටුවේ අනුමැතියට යොමු කරන ලදී. | ග්‍රාමීය මාර්ග සංවර්ධන යෝජනා සඳහා කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | |
| | | ➢ තවද විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ යෝජනා සඳහා රු.මි.10 බැගින් වෙන් කරමින් යෝජනා තෝරා ගැනීමට අදාලව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති (MF/02/2026/2026/01/16) චක්‍රලේඛයේ කරුණු පිළිබඳව සභාව දැනුවත් කරන ලදී. එමෙන්ම මේ වන විටත් අදාල චක්‍රලේඛය ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ලිඛිතව හා වට්සැප් මඟින් යොමු කර ඇති බවත් එම යෝජනා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වෙත යොමු කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට කඩිනමින් ඉදිරිපත් කිරීම සුදුසු බවත් ගරු මන්ත්‍රීතුමන්ලා වෙත යෝජනා කරන ලදී. | 2026.02.15 වන දිනට පෙර දිස්ත්‍රික් ලේකම් වෙත යෝජනා ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br>අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන<br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| | | ➢ ප්‍රජාශක්ති වැඩසටහනට අදාලව ග්‍රාමීය සංවර්ධන සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය මඟින් ලබාදෙන උපදෙස් පරිදි බාධාවකින් තොරව කටයුතු සිදුකරන බවත් තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රත්නෙළුම්විලයාය ග්‍රාම නිලධාරි වසමේ හැර අනෙකුත් සියලුම | අධ්‍යාපන අනුකමිටුව සඳහා ඉඩම් හා වාරිමාර්ග ගරු නියෝජ්‍ය අමාත්‍ය | |



නිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

<table>
<tr><th>අ.අ.</th><th>කාරණය</th><th colspan="5">සාකච්ඡා වූ කරුණ</th><th>තීරණය</th><th>වගකීම</th></tr>
<tr><td></td><td></td><td colspan="5">ග්‍රාම නිලධාරි වසම් වල ප්‍රජා සංවර්ධන සභා පිහිටුවා ඇති බවත් දන්වන ලදී.<br>➢ රාජ්‍ය පරිපාලන, පළාත්සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මහින් සංවාරක අනුකමිටුව හා අධ්‍යාපන අනු කමිටු පිහිටුවීම සඳහා කටයුතු කලයුතු බවට දැනුම් දී ඇති බවත් සභාවේ අවධානයට යොමු කරන ලදී.</td><td>අරවින්ද සෙනරත් මැතිතුමා ද සංවාරක අනුකමිටුවේ ගරු සභාපති ලෙස දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති නිහාල් ගලප්පත්ති මැතිතුමා කටයුතු කරන බවත් මෙම කමිටු ඉදිරියේ දී පැවැත්වීමට තීරණය කරන ලදී.</td><td></td></tr>
<tr><td>2.2</td><td>2025.12.31 දිනට අනෙකුත් ආයතනවල සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසීම</td><td colspan="7">සියළු ව්‍යාපෘති සම්බන්ධව මෙහිදී ප්‍රගතිය විමසීමක් සිදු කරන ලද අතර සියළුම ආයතන මහින් ඉදිරිපත් කරන ලද ප්‍රගතිය ඇමුණුම අංක 01 යටතේ ඉදිරිපත් කර ඇත.</td></tr>
<tr><td rowspan="7">03.</td><td>පළාත් සභා සංවර්ධන වැඩසටහන යටතේ 2025 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය</td><td colspan="6">සියළු ව්‍යාපෘති සම්බන්ධව මෙහිදී ප්‍රගතිය විමසීමක් සිදු කරන ලද අතර 2025.12.31 දිනට දැනුම් දෙන ලද ප්‍රගතිය පහත පරිදි ඉදිරිපත් කරන ලදී.</td><td rowspan="8">ප්‍රධාන ලේකම්, දකුණු පළාත<br><br>අමාත්‍යාංශ ලේකම්වරුන්, දකුණු පළාත් සභාව<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් හා මෙහෙයුම් (දකුණු පළාත)<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්</td></tr>
<tr><td>අමාත්‍යාංශය</td><td>අනුමත ප්‍රතිපාදන මුදල රු.මි.</td><td>අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව</td><td>ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව</td><td>වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව</td><td colspan="2">වියදම රු.මි.</td></tr>
<tr><td>ප්‍රධාන අමාත්‍යාංශය</td><td>591.36</td><td>249</td><td>21</td><td>228</td><td colspan="2">484.59</td></tr>
<tr><td>කෘෂිකර්ම අමාත්‍යාංශය</td><td>388.96</td><td>167</td><td>10</td><td>157</td><td colspan="2">357.66</td></tr>
<tr><td>ධීවර අමාත්‍යාංශය</td><td>294.26</td><td>94</td><td>7</td><td>87</td><td colspan="2">294.26</td></tr>
<tr><td>ක්‍රීඩා අමාත්‍යාංශය</td><td>137.58</td><td>63</td><td>-</td><td>63</td><td colspan="2">134.96</td></tr>
<tr><td>අධ්‍යාපන අමාත්‍යාංශය</td><td>477.32</td><td>115</td><td>16</td><td>99</td><td colspan="2">394.13</td></tr>
<tr><td>03.1</td><td>2026 වසරේ දකුණු පළාත් සභාව මහින් දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන වැඩසටහන්</td><td colspan="5">2026 වසරේ දකුණු පළාත් සභාව මහින් දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කිරීමට නියමිත පළාත් නිශ්චිත හා උපමාන පාදක සංවර්ධන වැඩසටහන් සම්බන්ධව 2026.01.14 වන දින ගරු සභාපතිතුමන් ඇතුළු අදාල පාර්ශව දැනුවත් කල බවත් මෙම ව්‍යාපෘති සඳහා දැනටමත් ප්‍රතිපාදන අනුමත වී ඇති බැවින් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය අවශ්‍ය බවත් දන්වන ලදී.</td><td>සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී.</td></tr>
<tr><td>04</td><td>සෞඛ්‍ය අංශයෙන් ඉදිරිපත් කරන ලද කරුණු.</td><td colspan="5">2026 වසරේ ජනවාරි මස තුන්වන සතිය තුල තංගල්ල, කුඩාවැල්ල ප්‍රදේශයේ ඩෙංගු වසංගතය පැතිරීමේ අවධානම වැඩි වී තිබෙන බවත් මෙම</td><td>ඩෙංගු වසංගතය මර්දනය කිරීම සම්බන්ධව සැලැස්මක් සකස් කර අදාල අංශ</td><td>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ</td></tr>
</table>



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | තත්වය කුඩාවැල්ල ධීවර වරාය ආශ්‍රිතව පැතිරෙන බවට කරුණු ඉදිරිපත් විය. භාවිතා නොකරන, අලුත් වැඩියා කරනු ලබන හා අබලන් වූ ධීවර යාත්‍රා හා ඉවත් කරන ලද කොටස් අවිධිමත් අයුරින් වරාය තුල පැවතීම, කැලි කසල හා අප ජලය කළමනාකරණය අවිධිමත්ව සිදුවීම, සනීපාරක්ෂක පහසුකම් හා අනෙකුත් පොදු පහසුකම් අවම වීම යන කරුණු මෙ සඳහා හේතුවන බවට දැක්වූ අතර මත් ද්‍රව්‍ය ප්‍රවාහනයට භාවිතා කර දැනට අත්අඩංගුවට ගෙන ඇති යාත්‍රා ද ජැටියේ වනතා තිබෙන අතර එම යාත්‍රා ද මදුරුවන් බෝවීම සඳහා බලපා තිබෙන බවත් දන්වන ලදී. | එක්වී විධිමත් සැලැස්මකට අනුව කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී.<br><br>නඩු කටයුතු සඳහා නවතා තිබෙන සියලුම ධීවර යාත්‍රා පිළිබඳ කඩිනමින් කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් තංගල්ල<br><br>අදාල අනෙකුත් ආයතන ප්‍රධානීන් (නාවික හමුදාව, වෙරල ආරක්ෂණ දෙපාර්තමේන්තුව, ධීවර වරාය.....ආදී)<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |
| 05 | දිස්ත්‍රික්කය තුළ පවතින ආරක්ෂක තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම. | මෙ වන විට දිස්ත්‍රික්කයේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් මහජන ආරක්ෂණ කමිටු 583 පිහිටුවා ඇති බවත් උපදේශන සභා 19 ක් ක්‍රියාත්මක වන බවට කරුණු ඉදිරිපත් විය.<br>එමෙන්ම නීතිය හා සාමය ආරක්ෂා කිරීමට විශේෂ මෙහෙයුම් සිදු කරන බවත් 2025 වසරේ මත් ද්‍රව්‍ය වැටලීම් වලින් ගංජා - 28,340g, හෙරෝයින් - 385g, අයිස් - 375g, මත්පෙති කරල් - 51 ක් ද මදනමෝදක 14ක් සහ වෙන් මත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් පුද්ගලයින් 06 දෙනෙක් ද පොලිස්භාරයට ගෙන තිබෙන බවට කරුණු ඉදිරිපත් විය. | දිස්ත්‍රික්කයේ ජාතික ආරක්ෂාව වෙනුවෙන් සියලුම මෙහෙයුම් සක්‍රිය ව සහ වේගවත් ලෙස සිදු කිරීමට උපදෙස් දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |
| 06 | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කෙටුම්පත ඉදිරිපත් කිරීම | ශ්‍රී ලංකාවේ පළමු වතාවට ඉඩම් පරිහරණ සැලැස්ම සහ ආයතනික නීති රෙගුලාසි අනපනත් සහිත දත්ත පද්ධතිය හඳුන්වා දීම සිදු කල අතර අවසන් සැලසුම් වාර්තාව මාර්තු මස මුද්‍රණය සඳහා යොමු කිරීමට කටයුතු කරන බවට වැඩිදුරටත් කරුණු ඉදිරිපත් විය. | සංශෝධනයන්ට යටත්ව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාදෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ ඉඩම් පරිහරණ |
| 08 | **ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මඟින් ඉදිරිපත් වී ඇති යෝජනා** | | | |
| 8.1 | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ව්‍යාපෘති පරීක්ෂණ (Lab Test) ගාස්තු වලට අදාල මිල ගණන් පෙර දැනුම් දීමකින් තොරව වෙනස් කිරීම. | අදාල පාර්ශවයන් විසින් ප්‍රවාහනයට අදාල පහසුකම් සැපයීමට හැකියාවක් පවතී නම් මීට අදාල ගාස්තු අඩුවන බවත් කාණ්ඩ වශයෙන් පරීක්ෂණ සිදු කිරීම හරහා මෙය අඩු කර ගැනීමට හැකි වූ බවත් 2026 වසරේ මේ තත්වය සිදු නොවන බවට කරුණු ඉදිරිපත් විය. තවද 2025 වසරේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට | 2026 වසරේ කොන්ත්‍රාත්කරුවන්ට ව්‍යාපෘති පරීක්ෂණ ගාස්තු වෙනස් නොවන බවට දැනුම් දෙන ලදී.<br><br>ගල් සැපයුම්කරුවන් 2026.02.03 දින | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය |



විමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | ඉදිරිපත්වූ කොන්ත්‍රාත්කරුවන්ට වසර අග භාගයේ ගල් වැලි වල සිදු වූ අසාමාන්‍ය මිල ඉහලයාම හේතුවෙන් පාඩු සිදු වූ බවත් එම නිසා ඔවුන් ව්‍යාපෘති ලබා ගැනීමට මැලිකමක් දැක්වූ බවටත් කරුණු වාර්තා විය. මෙවැනි තත්වයන් පාලනය සඳහා ගල්, වැලි සඳහා යම් මිලක් පවත්වාගෙන යාම සුදුසු බවටත් කරුණු දක්වන ලදී. | රැස්වීමට කැඳවා ඔවුන් දැනුවත් කිරීමට තීරණය විය. | දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>කැනීම් ඉංජිනේරු භූවිද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය |
| 8.2 | උද්ධකන්දර ග්‍රාමනිලධාරි වසමේ වැවේ යායේ සිට යෝධකණ්ඩිය ප්‍රධාන මාර්ගය දක්වා පාසල් ළමුන් ප්‍රවාහනයට පහසුකම් ලබාදෙන ලෙස ඉල්ලීම | මෙවැනි ගැටළු සාකච්ඡා කිරීමට 2026.02.03 වන දින ප්‍රවාහන හා මහාමාර්ග කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>ප්‍රාදේශීය ලේකම් ලුනුගම්වෙහෙර |
| 8.3 | ලුනුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිවාස යෝජනා වලින් ඉදිකරන ලද නිවාස වල 50% පමණ පදිංචි නොවීම නිසා ඇතිවන ගැටළු | විශේෂයෙන්ම නිවාස වල පදිංචි පවුල් වල සහ පදිංචි නොවූ පවුල් වල ඇති වී ඇති ගැටලු පිලිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමට නියමිත බවට දැනුම් දෙන ලදී. | මෙම නිවාස යෝජනා වල පදිංචි නිවාස සහ පදිංචි නොවූ නිවාස පිළිබඳ වාර්තාවක් ලබාදෙන ලෙස දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් කලමනාකරු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| 8.4 | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව සඳහා ආයතන කිහිපයක නිලධාරීන් නොපැමිණීම. | සංවර්ධන කටයුතු මෙන්ම අනෙකුත් කරුණු සඳහා තීරණ ගනු ලබන දිස්ත්‍රික්කයේ ප්‍රධාන රැස්වීම බැවින් දැනුම් දීමකින් තොරව නිලධාරීන් නොපැමිණීම ගැටළුවක් බවට දැනුම් දෙන ලදී. | අදාල නිලධාරියාට පැමිණීමට නොහැකි නම් වෙනත් නිලධාරියෙකු සහභාගී කරවීම ආයතන ප්‍රධානීන්ගේ වගකීමක් බවත් නොපැමිණෙන නිලධාරීන් සම්බන්ධව නිදහසට කරුණු විමසා අදාල ආයතන වලට දැනුම් දෙන ලෙසත් තීරණය කරන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සියලුම සාමාජිකයින් |
| 8.5 | වීරවිල සත්ත්ව ගොවිපලට අයත් ඉඩම කැලෑවීම සහ එහි ගවගාල් කිරීම හේතුවෙන් දකුණු ඉවුර යාය 2 ගොවි සංවිධාන බල ප්‍රදේශය තුලට වන අලීන්ගෙන් හා ගවයින් ගෙන් හානි මතුවීම. | මෙම ඉඩම අක්කර 27 ක සින්නක්කර ඉඩමක් වන අතර අයිතිය ජෝන් කීල්ස් සමාගම සතු වන බවත් අවස්ථා කිහිපයක දී ම ලිඛිතව මෙම භූමිය සුද්ධ පවිත්‍ර කර දෙන ලෙස එම ආයතනය දැනුවත් කල ද කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොමැති බවට කරුණු ඉදිරිපත්විය. | පීඩාවට පත්වූ පුද්ගලයින් කිහිපදෙනෙක් වීරවිල පොලිසියට ඉදිරිපත් වී මහජන පීඩාකිරීම පනත යටතේ අදාල පෞද්ගලික ආයතනයන්ට නඩු පැවරීම සිදු කරන ලෙසත් වීරවිල ගොවිපලට අයත් භූමි කොටස ගොවිපල විසින් සුද්ධ කිරීමේ කටයුතු කලයුතු බවටත් උපදෙස් දෙන ලදී. | සභාපති ප්‍රාදේශීය සභාව ලුනුගම්වෙහෙර<br><br>ප්‍රාදේශීය ලේකම් ලුනුගම්වෙහෙර<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |

විමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 09 | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් වී ඇති යෝජනා | | | |
| 9.1 | රුහුණු රිදියගම කෘෂි පාරිසරික ගොවිපල අයත් ඉඩම පවරා ගැනීම | රිදියගම නිවර්තන නිවාසය සඳහා අත්පත් කරගත් අක්කර 25 ඉඩමක දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගොවිපලක් පවත්වා ගෙන යන අතර දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්මේන්තුවට මෙම ඉඩම් කොටස පවරා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. එහෙත් මෙම ඉඩම සම්බන්ධව ගරු අධිකරණය තුල නඩු කටයුතු සිදුවෙමින් පවතින බවත් කෙසේ වෙතත් අත්පත් කරගැනීමේ අරමුණින් බැහැරව ඉඩම් නිදහස් කිරීමේ හැකියාවක් ප්‍රාදේශීය ලේකම්ට නොමැති බවත් සඳහන් කරන ලදී. | මේ අනුව ඉදිරි කටයුතු සිදු කරන ලෙස පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට දැනුම් දීමට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>ලේකම් දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය<br><br>ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට |
| 9.2 | මිද්දෙණිය නගරයේ මාර්ග පද්ධතිය නවීකරණය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම | මාතර-හුංගම ප්‍රධාන මාර්ගයේ මුරුංගස්යාය හන්දියේ සිට වැලිපිටිය හන්දිය දක්වා දෙපස වාහන නතරකර තැබීමේ මංතීරුවක් හා සේවා මංතීරුවක් සහිතව මාර්ගය පුළුල් කර කාපට් ඇතිරීම.<br>මිද්දෙණිය-වීරකැටිය මාර්ගයේ කුඩගල් ආර දක්වාත්, දෙපස වාහන නතර කර තැබීමේ මංතීරුවක් හා සේවා මංතීරුවක් සහිතව මාර්ගය පුළුල් කර කාපට් ඇතිරීම. | මෙම යෝජනා ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ප්‍රගතිය ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන ලදී. | ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය |
| 9.3 | යෝජිත සුළං විදුලි ව්‍යාපෘතිය සඳහා මහවැලි අධිකාරියේ ඉඩම නිදහස් කිරීම සඳහා | මේ සම්බන්ධව භූමිය හඳුනාගත් අතර අක්කර 09 ක භූමි ප්‍රමාණය ප්‍රාදේශීය සම්බන්ධීකරණ අනුමැතිය ලබාගත් බවට ද ජනතා විරෝධය සහ පරිසර හානියක් සිදුනොවන බවටත් මේ තුලින් රජයට බද්ධක් ලබාදෙන බවටත් කරුණු ඉදිරිපත් විය. | ජනතාවගේ ගැටළුවක් නොමැති බැවින් මෙම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාදෙන ලදී. | නේවාසික ව්‍යාපාර කළමනාකරු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |
| 10 | සාකච්ඡා කරන ලද වෙනත් කරුණු | | | |
| 10.1 | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා ගැනීම | හ/යටාලතිස්ස ප්‍රාථමික විද්‍යාලයීය ව්‍යුහ කමිටු තීරණ පරිදි 2.26 වර්ෂයේ සිට 1 ශ්‍රේණියේ සමාන්තර පන්ති සංඛ්‍යාව එකකින් අඩු කිරීම.<br><br>හ/දෙබරවැව කනිටු විද්‍යාලයීය ව්‍යුහ කමිටු තීරණ පරිදි 2026 වර්ෂයේ සිට ප්‍රාථමික අංශයේ සමාන්තර පන්ති සංඛ්‍යාව එකකින් අඩු කිරීම සහ ද්විතීක අංශයේ සමාන්තර ශ්‍රේණි හය බැගින් පවත්වා ගැනීම.<br><br>මෙම යෝජනාව සඳහා දිස්ත්‍රික් අධ්‍යාපන සැලසුම් සකස් කිරීමේ කමිටුවේ දී අවධානය යොමු කර අදාල එකඟතාව ලැබී ඇති බවත් දන්වා සිටින ලදී. | මේ සඳහා කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හම්බන්තොට |



බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 10.2 | රිදියගම වැව රක්ෂිතයේ මායිම් සලකුණු කිරීමේ දී නිවෙස් සහ ඉඩම් අහිමි වීම පිළිබඳ ගැටළු | රිදියගම වැව රක්ෂිතයට අදාල සීමා මායිම් සලකුණු කිරීම පමණක් සිදුකරමින් පවතින බවට කරුණු දැක්විය. | තිස්ස රිදියගම වැව දෙකේ ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මෙතෙක් දැනුම් දී නොමැති බවට උපදෙස් දෙන ලදී. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 10.3 | නව ජල යෝජනා ක්‍රමය සඳහා ප්‍රමුඛතම ග්‍රාමීය ප්‍රදේශ හඳුනා ගැනීම. | මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා 2026.02.10 වන දිනට යොමු කිරීමට තීරණය කරන ලදී. | | ප්‍රාදේශීය කලමනාකරු ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය. |
| 11 | පසුව ලැබුණු ලිපි | | | |
| 11.1 | තංගල්ල ප්‍රදේශය තුල අයාලේ යන සුනඛ ගහනය වැඩිවීම. | තංගල්ල නගර සීමාව තුල අයාලේ යන සුනඛයන් වැඩි වීමත් සමග ගැටළු රැසකට මුහුණ දීමට සිදු වී ඇති බවට මහජන පැමිණිලි ලැබී ඇති බවට ත් එම සුනඛයින් ගාල්ලේ සුනඛ සුරක්ෂිතාගාරය වෙත යොමු කරන ලෙස යෝජනා විය. එමෙන්ම සුනඛ සුරකුම් මධ්‍යස්ථානයක් සකස් කිරීම සඳහා අක්කරයක පමණ භූමියක් ලබාදීමට කටයුතු කරන ලෙස ද යෝජනා විය. | තංගල්ල නගර සීමාව තුල විදේශ ආධාර ලබාගැනීමේ අරමුණින් සුනඛ අනාථාගාරයක් පවත්වාගෙන යාමට අදාලව නඩු තීන්දු ගැනීම සිදුකරන ලෙසත් සුනඛ සුරකුම් මධ්‍යස්ථානයට අදාල ඉඩම් තිබේනම් හඳුනාගෙන ඉදිරිපත් කරන ලෙසත් දැනුම් දෙන ලදී. | සභාපති තංගල්ල නගර සභාව<br><br>ප්‍රාදේශීය ලේකම් තංගල්ල |
| 11.2 | ගිනිගල් ආර වැව දක්වා ජලය ලබා ගැනීම සඳහා ඇල මාර්ගයක් සකස් කර ගැනීම | වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඕමාර බටහිර-ඇත්පිටිය මායිමේ වෙරලු ගස්මුල්ල යායේ මුරුංග ගෙදර අසලින් ඕමාර බටහිර ගිනිගල් වැවට ජලය ලබා ගැනීම සඳහා ඇල මාර්ගයක් අවශ්‍ය බවත් මෙමඟින් අක්කර 20 ප්‍රමාණයක වගා කල හැකි බවත් කරුණු ඉදිරිපත් විය. 2026 වර්ෂය සඳහා ඇල මාර්ග සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බවත් මෙම ව්‍යාපෘතිය ද ක්‍රියාත්මක කිරීමේ හැකියාව සම්බන්ධව අවධානය යොමු කල හැකි බවත් සඳහන් විය. | මෙම ව්‍යාපෘති යෝජනාව ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කර බලා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සහිතව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමටුවේ අනුමැතියට ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් වලස්මුල්ල<br><br>ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු වීරකැටිය<br><br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් හම්බන්තොට |
| 11.3 | කිරම රෝහලට දන්ත වෛද්‍යවරයෙක් කඩිනමින් ලබාගැනීම | රෝහලේ දැනට දන්ත වෛද්‍ය ඒකකයට අදාල රුපියල් මි.1 උපකරණ පැවතින අතර මේ නිසා සතියකට දින දෙකක් වත් දන්ත වෛද්‍යවරයෙක් යොමු කිරීමේ වැදගත්කම ඉදිරිපත් කරන ලදී. | මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කරමින් කඩිනමින් පියවර ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| 11.4 | සූරියවැව මයුරපුර කොට්ඨාසයේ තැලවිල්ල අක්කර 05 භූමිය පෞද්ගලික ආයතනයකට බදු මත පැවරීම | මෙම භූමිය ආදාහනාගාරයක් සඳහා ලබාදුන්න ද මේ වන තෙක් කිසිදු ප්‍රයෝජනයක් ලබානොගැනීම නිසා බදු පදනම මත පෞද්ගලික ඇඟලුම් ආයතනයකට ලබා දීමට කටයුතු කිරීම සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කර සාකච්ඡා කරන ලද බවත් එහි අනුමැතිය මේ සඳහා ලැබුණු අතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් කල බවට කරුණු ඉදිරිපත් විය. | මේ පිළිබඳ තවදුරටත් සාක්ච්ඡා කොට තීරණයක් ගතයුතු බවට උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් සූරියවැව |
| 11.5 | පශු වෛද්‍ය කොට්ඨාස මට්ටමින් සමිති පිහිටුවීම | මේ සම්බන්ධව තොරතුරු අද දින ලැබුනු හෙයින් යොදාගත් දිනයන්හි නියෝජිතයින් සම්බන්ධ කල නොහැකි බවට කරුණු දැක්වීමත් සම ලේකම් තනතුරු සඳහා කොට්ඨාස 12 න් නියෝජිතයන් නම් කර යුතු බවට කරුණු ඉදිරිපත් විය. | සම ලේකම් තනතුරු සඳහා කොට්ඨාස 12 ට අයත් නියෝජිතයින් කඩිනමින් නම්කරන ලෙස උපදෙස් දෙන ලදී. | සියලුම ප්‍රාදේශීය ගරු සභාපතිවරු<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>කාර්යභාර ආයුර්වේද වෛද්‍ය නිලධාරි |
| 11.6 | ඛනිජ වැලි නිස්සාරණ ව්‍යාපෘතියක් සඳහා වාර්ෂික බදු පදනම යටතේ ඉඩම් කොටසක් ලබාදීම | මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ව සඳහා යොමු කිරීම | | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට |
| 11.7 | පානීය ජල සැපයුම අඩාලවීම හේතුවෙන් ඇති වී ඇති ආපාදා තත්වය | කුඩාවැල්ල සිනිමෝදර පාලම දක්වාත් දික්වැල්ල බෙලිඅත්ත පාරේ සිට නලගම දක්වා ජල සැපයීම මාතර ජල සැපයුම විසින් සිදු කරන අතර මෙම ජල සැපයුම සතියකට දින එකක් හෝ දෙකක් සිදුවේ. මාතර ජල යෝජනා ක්‍රමය සංවර්ධනය කරන බවට දැනුම් දුන්නද මේ වන තෙක් එය සිදු නොවීම නිසා කුඩාවැල්ල බල ප්‍රදේශයට බවුසර් මඟින් ජලය සැපයීම තංගල්ල ජල සැපයුම විසින් සිදු කරනු ලැබේ. නමුත් කුඩාවැල්ල අවට පවුල් 6000 ට මෙම ජලය පරිභෝජනයට නුසුදුරු මට්ටමකින් පවතින බවත් අධික ක්ලෝරීන් සාන්ද්‍රනය වැඩිවීම නිසා මෙම තත්වය ඇති වී තිබෙන බවට කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධව 2026.01.30 වන දින පස්වරු 1.00 ට තංගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී විශේෂ සාකච්ඡාවක් දික්වැල්ල ජලසම්පාදන මණ්ඩලය සමඟ පැවැත්වීමට කටයුතු සැලැසුම් කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් තංගල්ල<br>ප්‍රාදේශීය කළමනාකරු ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය. |
| 11.8 | වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිතුමා ගේ ස්ථාන මාරුවීම සම්බන්ධව | මුලටිය කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන් සේවය කර සිටියදී වීරකැටිය රාජපක්ෂ විද්‍යාලයේ විදුහල්පතිවරයා වශයෙන් අනියුක්තයක් ලෙස වැඩ ආවරණය කල අතර විමර්ශන කටයුතු සිදුවන හෙයින් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විදුහල්පති තනතුර අවලංගු කර තිබේ. එම නිසා නැවත නිත්‍ය සේවා ස්ථානය ලෙස මුලටියන | දකුණු පලාත් ආණ්ඩුකාරතුමිය මේ පිළිබඳව දැනුවත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රධාන ලේකම් දකුණු පලාත<br>ලේකම් දකුණු පලාත් අධ්‍යාපන අමාත්‍යාංශය |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | කලාප අධ්‍යාපන කාර්යාලය වූව ද පලාත් රාජ්‍ය සේවයට අයත් නිලධාරින්ගේ වසර 5 ට අයත් නිලදාරින්ගේ ස්ථාන මාරු කිරීමේ ක්‍රමවේදය යටතේ ඔහුගේ මනාපය අනුව වලස්මුල්ල, තංගල්ල හා හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාල ඉල්ලීම සිදු කර තිබූ බැවින් වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලය සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ලෙස නව සේවා ස්ථානය ලැබී තිබෙන බවට කරුණු ඉදිරිපත් විය. පලාත් රාජ්‍ය සේවා කොමිසන් සභාවෙන් සිදු වූ අඩුපාඩුවක් බවට දැනුම් දෙන ලදී. | | පලාත් අධ්‍යාපන අධ්‍යක්ෂක දකුණු පලාත |
| 11.9 | තොරාගත් වැව් කිහිපයක මැටි ඉවත් කිරීම සඳහා අවසර ඉල්ලා සිටීම | තිස්සමහාරාම මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් කෞතුකාගාරයක් ගොඩනැගීමට කටයුතු කරන අතර ඊට අවශ්‍ය ගඩොල් සපයා ගැනීම සඳහා ගඩොල් කර්මාන්තයට අවශ්‍ය මැටි ලබා ගැනීම සඳහා තෝරාගත් වැව් කිහිපයක මැටි ඉවත් කිරීමට අවශ්‍ය බවට කරුණු ඉදිරිපත් විය. | දිස්ත්‍රික්කයේ වැව් වලට අදාල ආයතන පලාත් වාරිමාර්ග, වාර්මාර්ග සහ ගොවිජනසේවා ආදි අදාල ආයතන මගින් ඉල්ලීම් කිරීමට උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් තිස්සමහාරාම |
| 11.10 | වනඅලි කළමනාකරණය සම්බන්ධ ගැටලුව | 2026.01.28 වන දිනයේ දි වන අලි කළමනාකරණය වෙත යොමු කිරීමේ දි ඩ්‍රෝන යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට වනජීවි නිලධාරියෙක් සම්බන්ධ නොවීම සම්බන්ධව කරුණු ඉදිරිපත් විය. | ඩ්‍රෝන කැමරාව ක්‍රියාත්මක කිරීමට නිලධාරියෙක් කඩිනමින් යොමු කරන ලෙස උපදෙස් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ වනජීවි |
| 11.11 | මී මැසි පාලනය තුලින් වන අලි කළමනාකරණයට අදාල ව්‍යාපෘති පරික්ෂණය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම | මේ සම්බන්ධව වෙනමම සාකච්ඡාවක් සවිස්තරාත්මකව සිදුකල යුතු බැවින් අදාල අදාල පාර්ශව කැඳවා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කරන ලෙස දකුණු පලාත් කාර්මික සංවර්ධන අධිකාරියේ සභාපති වෙත උපදෙස් දෙන ලදී | | සභාපති කාර්මික සංවර්ධන අධිකාරිය |

අද දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තුතිය පල කිරීමෙන් අනතුරුව පස්වරු 1.30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය
2026 පෙබරවාරි මස ..10.....................
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනෙකුත් ආයතනවල සංවර්ධන ව්‍යාපෘතිවල 2025.12.31 දිනට ප්‍රගතිය (එක් එක් ආයතනය මගින්

| අ.අ | ආයතනය | ව්‍යාපෘති සංඛ්‍යාව | 2025 වර්ෂයට වෙන්කළ මුදල (රු.මි.) | 2025.12.31 දිනට | | |
|---|---|---|---|---|---|---|
| | | | | ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම රු.මි. |
| 1 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 5 | 1,912.87 | 3 | 2 | 1,297.06 |
| 2 | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | 5 | 69.21 | - | 5 | 67.76 |
| 3 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 38 | 116.92 | | 38 | 92.74 |
| 4 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 109 | 235.06 | 9 | 100 | 223.37 |
| 5 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 8 | 34.88 | | 8 | 33.54 |
| 6 | ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා) | 4 | 9.23 | 1 | 3 | 9.10 |
| 7 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 1 | 1.90 | | 1 | 1.90 |
| 8 | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය ( නාගරික සංවර්ධන අධිකාරිය) | 1 | 31.16 | 1 | | 6.10 |
| 9 | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය (නිවාස සංවර්ධන අධිකාරිය) | 4 | 191.05 | 1 | 3 | 179.15 |
| 10 | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | 13 | 54.26 | 8 | 5 | 50.56 |
| 11 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 142 | 848.66 | 41 | 101 | 194.66 |
| 12 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 33 | 98.07 | 7 | 26 | 72.90 |
| 13 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (දකුණු කළාපය) - පරිසර අමාත්‍යාංශය | 24 | 29.72 | 2 | 22 | 25.72 |
| 14 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව - පරිසර අමාත්‍යාංශය | 12 | 42.49 | | 12 | 42.49 |
| 15 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - පරිසර අමාත්‍යාංශය | | | | | |
| 16 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව - පරිසර අමාත්‍යාංශය | 16 | 19.2 | | 16 | 13.03 |
| 17 | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය (අන්තර් පළාත්) | 13 | 34.32 | | 13 | 33.79 |
| 18 | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය (ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය) | 17 | 2.18 | | 17 | 2.17 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 19 | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය (කාන්තා හා ළමා කටයුතු ඒකකය) | 4 | 454.05 | | 4 | 454.05 |
| 20 | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය ( ළමා ආරක්ෂණ අධිකාරිය) | 11 | 0.83 | | 11 | 0.53 |
| 21 | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය ( ළමා හිමිකම්) | 11 | 3.87 | | 11 | 3.75 |
| 22 | පොල් සංවර්ධන මණ්ඩලය | 12 | 10.26 | | 12 | 9.82 |
| | එකතුව | **483** | **4,200.19** | **73** | **410** | **2,814.19** |